22100268

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Friday 14 May 2010 (morning)
Vendredi 14 mai 2010 (matin)
Viernes 14 de mayo de 2010 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Traitez un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3e partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2e partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3e partie n'obtiendront pas une note élevée.
- Vous n'êtes pas autorisé(e) à amener des exemplaires des œuvres que vous avez étudiées dans la salle d'examen.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.
- No se permite traer a la sala de examen copias de las obras estudiadas.


© International Baccalaureate Organization 2010

https://xtremepape.rs/

පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේදී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතුය.

අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුවද පිළිතුරේදී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

## සම්භාව්‍ය සාහිත්‍යය

1. "සම්භාව්‍ය සාහිත්‍ය කෘතීන්හි අන්තර්ගත බොහෝ සිදුවීම් පාඨක සිත් තුළ ආගමික හැඟීම් ජනිත කරවන අතර චරිත නිරූපණය හා එම චරිතවල චිත්ත අභ්‍යන්තරය විදහා දක්වන ආකාරය මගින් රස දැනවීමට ද සමත් වෙයි." ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් මෙය විමසන්න.

2. සමාජයට උපදේශ දීමේ පරමාර්ථය සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලින් කෙතරම් ප්‍රබලව ඉටු වී ඇද්ද? ඔබ හදාරා ඇති කෘති දෙකක් පාදක කරගනිමින් අදහස් දක්වන්න.

## නාට්‍ය කලාව

3. "නාට්‍යයක සාර්ථකත්වය රඳා පවතිනුයේ විශේෂයෙන්ම එහි ගැටුම ඉදිරිපත් වන ආකාරය මතය." මෙම අදහසට ඔබ එකඟ වන්නෙහිද? ඔබ හදාරා ඇති කෘති දෙකක් ආශ්‍රයෙන් විමසන්න.

4. නාට්‍ය කරුවන් සිය නිර්මාණවල ප්‍රධාන චරිත වඩාත් සංකීර්ණ ලෙස නිරූපණය කිරීම සඳහා කොතරම් සාර්ථක අන්දමට අතුරු චරිත යොදාගෙන ඇද්ද? ඔබ හදාරා ඇති නාට්‍ය දෙකක් ඇසුරු කරගනිමින් විමර්ශනය කරන්න.

## නවකථාව

5. ඔබ හදාරා ඇති නවකථා අතුරෙන් දෙකකට විෂය වී ඇති පොදු තේමාවක් තෝරාගනිමින් කතුවරුන් දෙදෙනා එය ඉදිරිපත් කරන ආකාරය සන්සන්දනාත්මකව විමසන්න.

6. ඔබ හදාරා ඇති නවකථා දෙකක චරිත නිරූපණය වී ඇති ආකාරය අනුව එම චරිත කෙරෙහි කතුවරුන් දෙදෙනා දක්වන ආකල්ප සන්සන්දනාත්මකව විග්‍රහ කරන්න.



https://xtremepape.rs/

## කාව්‍යය

**7.** ඔබ හදාරා ඇති පද්‍ය රචකයන් දෙදෙනකුගේ නිර්මාණවල සමකාලීන සමාජ ප්‍රශ්න නිරූපණය වී ඇති ආකාරය හා ඒවායේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වන්න.

**8.** "කාව්‍ය රචනාවක භාෂාව එදිනෙදා ව්‍යවහාර වන භාෂාවට සමාන ලෙස, කෙලින්ම අදහස් ඉදිරිපත් කරන ආකාරයෙන් යොදාගත හොත් එහි අගය හීන වෙයි." මෙය කොතෙක් දුරට පිළිගත හැකිද? ඔබ හදාරා ඇති කතුවරුන් දෙදෙනකුගේ නිර්මාණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

## කෙටිකතා

**9.** ඔබ හදාරා ඇති කෙටිකතා කරුවන් දෙදෙනකු විසින් රචිත කෙටිකතා අතුරෙන් දෙකක් තෝරාගෙන එම කතුවරුන් අනුගමනය කර ඇති රචනා විලාසය පිළිබඳවත්, එය අදාළ තේමාවන්ට කොතරම් ගැළපේද යන්නත් සන්සන්දනාත්මකව විමසන්න.

**10.** "කෙටිකතාවක් මගින් දීර්ඝ ලෙස, පුළුල් චරිත නිරූපණයක් කළ නොහැකිය." එසේ නම් දක්ෂ කෙටිකතා කරුවකුට, විශ්වසනීයත්වයෙන් යුත් ගැඹුරු චරිත නිරූපණය කළ හැක්කේ කෙසේදැයි ඔබ හදාරා ඇති කෙටිකතා කරුවන් දෙදෙනකුගේ නිර්මාණ දෙකක් ඇසුරෙන් විමසන්න.

## පොදු ප්‍රශ්න

**11.** "යථාර්ථය හා කල්පිතය මැනවින් මිශ්‍ර වී තිබීම හොඳ සාහිත්‍ය කෘතියක ලක්ෂණයකි." මෙය පිළිගත හැකිද යන්න ඔබ හදාරා ඇති කෘති දෙකක් පාදක කරගනිමින් විමසන්න.

**12.** "සාහිත්‍යය යනු සමාජය පිළිබිඹු කරන කැඩපතකි." ඔබ හදාරා ඇති කෘති දෙකක් තෝරාගෙන ඒ අතුරෙන් වඩාත් සාර්ථක ලෙස සමාජය පිළිබිඹු වන්නේ කවර කෘතියෙන්ද යන්නත් එසේ වීමට එහි යෙදී ඇති කවර සාහිත්‍ය ලක්ෂණ හේතු වී ඇද්ද යන්නත් විග්‍රහ කරන්න.

**13.** "සාහිත්‍යයෙන් අපේක්ෂිත පරමාර්ථ විවිධාකාර විය හැකි වුවද රස ජනනය කිරීම එහි අත්‍යවශ්‍ය පරමාර්ථයකි." ඔබ හදාරා ඇති කෘති දෙකක් පාදක කරගනිමින් විමසන්න.

**14.** ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘති අතුරෙන් දෙකක් තෝරාගෙන ඒවායේ අන්තර්ගත විශේෂ නිර්මාණාත්මක ලක්ෂණ පැහැදිලි කරන්න.



https://xtremepape.rs/